# 7 යුතුකම් ඉටු කරමු

අපි සමාජ ජීවියෝ වෙමු. එනම් ඔබට හෝ මට හෝ මිනිසුන් වන අප කිසිවකුට තනි තනි ව, අන් කිසිවකු සමග කිසිත් සබඳතාවක් නැති ව, සම්පූර්ණයෙන් ම වෙන් ව හුදකලාව ජීවත් විය නොහැකි ය. සමාජය දැලක් වැනි ය. එහි ජීවත්වන අපි එකිනෙකාට සම්බන්ධ වී සිටිමු; එකිනෙකාට බලපාන්නෙමු; එකිනෙකාගේ උපකාරය ඇත්තෝ වෙමු. අප අතර ශිෂ්ට සම්මත සමාජ සබඳතා ඇති වීමටත් ඒවා නිසි ලෙස පවත්වාගෙන යාමටත්, මහෝපකාරීවන්නේ යුතුකම් ඉටු කිරීම ය. ඒවා මුල්කොටගත් අගනා පිළිවෙත් සමාජ ධර්ම නම් වෙයි. තිරිසන් සත්තු සමාජ ධර්ම නො දනිති. ඒ හේතුවෙන් ඔවුනට දියුණු සමාජයකට අඩිතාලම දමාගත නොහැකි ය. සාමයෙන්, සතුටින් ජීවත් විය නොහැකි ය. මිනිසුන් වන අපි දියුණුව කැමැත්තෝ වෙමු. අන්‍යෝන්‍ය විශ්වාසයෙන් සාමයෙන් හා සතුටින් ජීවත්වීමට ද කැමැත්තෝ වෙමු. බුදුදහම ඒ සඳහා අපට මග පෙන්වයි.

සිගාලක ගෘහපති පුත්‍රයාට බුදුරදුන් වදාළ සදිසා නමස්කාරය සමාජ සබඳතාවන්ගේ ධාර්මික පිළිවෙත උගන්වයි. එහි දී සදිසාව තේරුම් කර ඇත්තේ මෙසේ ය.

| | |
|---|---|
| නැගෙනහිර | මව්පියෝ |
| දකුණ | ගුරුවරු |
| බටහිර | අඹුදරුවෝ |
| උතුර | මිතුරෝ |
| යට | සේවකයෝ |
| උඩ | පැවිද්දෝ |

මෙහි නමස්කාරය යනු යුතුකම් හා වගකීම් හොඳින් වටහා ගනිමින් ක්‍රියා කිරීම ය. ඒ ඒ සමාජ කොටස් එකිනෙකාට නොයෙක් අයුරින් සංග්‍රහ කිරීම ය.

## මව්පියන් සහ දූදරුවෝ

මිනිස් සමාජයෙහි මාපියන් හා දූ පුතුන් අතර ඇති සෙනෙහසින් බැඳි සබඳතාව අන් කිසිදු මානව සබඳතාවකට දෙවැනි නො වේ. එය හදවතින් ම බැඳුණු බැම්මකි. බුදුරදුන් දවස භාරතීය බමුණන් ඉගැන්වූ පරිදි ලොව උතුම් මැ දෙවියා නම් මහා බ්‍රහ්මයා ය. එය බැහැර කරන බුදුදහමට අනුව බ්‍රහ්මයෝ නම් මාපියෝ ය. සැබෑ නිකැලැල් මෙත් සිතින්, හදපත්ලින් ම උපන් කුලුණු සිතින්, සැපත, සතුට දක උපදනා මුදිතායෙන්, අන්තවාදී නො වූ මැදහත් සිතින්, දූ පුතුන් රක්නෝ නම් මාපියෝ ය. මෙකී බ්‍රහ්ම විහාර ඇති බැවින් මාපියෝ බ්‍රහ්ම නම් වෙති.

ජීවිතයේ අත්‍යවශ්‍ය වූ බොහෝ දෑ මුලින් ම උගන්වන ඔවුහු පුබ්බාචරිය නමින් ද හැඳින්වෙති. දරුවන් විසින් පිදීමට සුදුස්සෝ වන ඔවුහු ආහුණෙය්‍යා නම් වෙති. තමන් මෙලොවට බිහිකොට, පෝෂණය කොට, බොහෝ උපකාර කොට, ලෝකය පෙන්වූ ඒ මාපියනට උවටැන් කිරීම, මහලු වූ විට රැකබලා ගැනීම දරුවන්ගේ යුතුකම වන බව ද දහමෙහි දක්වෙයි. සදිසා නමස්කාරය අනුව දූ දරුවන් විසින් තම දෙමාපියන් උදෙසා ඉටු කළ යුතු යුතුකම් හෙවත් සංග්‍රහ පසකි.



1. දෙමාපියන් පෝෂණය කිරීම
2. ඔවුන්ට අවශ්‍ය කටයුතු කරදීම
3. පරපුර රැකගැනීම
4. උරුම ව ඇති දේපළ ආදිය ආරක්ෂා කිරීම
5. මියගිය පසු පින්පෙත් දීම

මෙසේ දරුවන්ගෙන් සංග්‍රහ ලබන දෙමාපියන් විසින් ද කරුණු පහකින් දරුවන්ට සංග්‍රහ කළ යුතු ය. යුතුකම් ඉටු කළ යුතු ය.

1. දරුවන් පවින් වැළැක්වීම
2. යහපතෙහි පිහිටුවීම
3. ශිල්ප ඉගැන්වීම
4. සුදුසු වයසේ දී ආවාහ විවාහ කර දීම
5. සුදුසු කල දායාද පවරා දීම

## ගුරුවරුන් හා ශිෂ්‍යයෝ

ගුරුවරු ද මාපියන් තරමට ම සමාජය තුළ වැදගත් තැනක් ගනිති. බුදුරජාණන් වහන්සේ හැඳින්වෙන්නේ සත්ථා-ශාස්තෘන් වහන්සේ නමිනි. එහි අර්ථය නම් දෙවියන්ගේ ද මිනිසුන්ගේ ද ගුරුවරයා යන්න යි. උන්වහන්සේ තිලෝගුරු ය. අව්‍යාජ වූ මහා කරුණාවෙන් සුවහසක් ගිහි-පැවිදි සිසුන්ට මග පෙන්වූ උන්වහන්සේ ඒ සිසුන්ගේ ද නො මද සත්කාර ගරුකාර මානන පූජන ලදහ.

උන්වහන්සේ විසින් පිහිටුවන ලද පරමාදර්ශී ශිෂ්‍ය ශ්‍රාවක සමාජය භික්ෂු සමාජය යි. එය ද ගුරුශිෂ්‍ය සංවිධානයකි. එහි ආදර්ශය වන්නේ ගුරු සිසු සබඳතාව පියපුතු සබඳතාවක් සේ පැවැත්වීම ය. බුදුරජාණන් වහන්සේ එදා සිදුහත් බෝසත් අවධියෙහි තමන් වහන්සේට මග පෙන්වීමට ඉදිරිපත් වූ ආලාරකාලාම, උද්දකරාමපුත්ත යන ගුරුවරුන් ගැන ද බුදුබවට පත්වීමෙන් පසු විශේෂ අවධානයක් ඇති ව ක්‍රියා කළහ. ඔවුහු කෙලෙස් අඩු, අනුගමනය කිරීමට සුදුසු උසස් ආධ්‍යාත්මික දියුණුවක් ඇති, උතුමන් ලෙස ද වටිනා පඬිවරුන් ලෙස ද හැඳින්වූහ. මුල් ම දම් දෙසුම ද ඔවුන් උදෙසා පැවැත්වීමට අවධානය යොමු කළහ. සදිසා නමස්කාරය අනුව සිසුන් ගුරුවරුන් වෙනුවෙන් කළයුතු සංග්‍රහ මෙසේය.

1. අසුනින් නැඟී සිටීම් ආදියෙන් ගෞරව කිරීම
2. උපස්ථාන කිරීම
3. මනාව ගුරුවරයාට සවන් දීම
4. කුඩු මහත් කටයුතු ඉටු කිරීම
5. මනාව ඉගෙනීම

සිසුන් විසින් මෙසේ සංග්‍රහ කරනු ලබන ගුරුවරුන් ද සිසුන්ට කරුණු පහකින් සංග්‍රහ කළ යුතු ය.

1. මනාව හික්මවීම
2. හොඳින් ඉගැන්වීම
3. නොඅඩුව ඉගැන්වීම
4. හිතවතුන්ට හඳුන්වා දීම
5. හැමවිට ම රැකවරණය සැපයීම

## අඹු සැමියෝ

සමාජ සංවිධානය විවිධාකාර වූ ඒකක හෙවත් සංස්ථාවන්ගෙන් සමන්විත ය. ශිෂ්ට සම්මත අඹු සැමි එකතුවෙන් තැනෙන පවුල එහි මූලික ඒකකය වේ. එම පවුල් සංස්ථාවේ පැවැත්ම රඳාපවත්නේ බිරිඳත්, සැමියාත් අතර ඇති සම්බන්ධය මත ය. පවුලේ සාමයත්, දියුණුවත්, සතුටත් එ සේ ම දූ පුතුන්ගේ යහපතත් සැලසෙන්නේ එම පසුබිම අනුව ය. යහපත් අඹු සැමි සම්බන්ධය බුදුදහම හඳුන්වන්නේ දෙවියකු හා දෙවඟනක එක් ව විසීමක් ලෙස ය.

එ සේ ම ශ්‍රද්ධාව හෙවත් ආගමික ලැදියාවෙන් ද, ශීලය හෙවත් පිරිසිදු චරිතයෙන් ද, ත්‍යාගශීලී බව හෙවත් පරාර්ථකාමීත්වයෙන් ද, ප්‍රඥාව හෙවත් ඇති තතු දැක්මේ හැකියාවෙන් ද අඹුසැමියන් සමාන විය යුතු යැයි බුදුරදුන් උගන්වා තිබේ. ගිහියන්ට **ශිෂ්ට සම්මත අඹු සැමි ජීවිතයක් පවත්වා ගෙන යාමට බුද්දහම අනුව අවස්ථාව තිබේ.** බිරිඳ මෙන් ම සැමියා ද කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකී එකිනෙකා කෙරෙහි විශ්වාසයෙන් බැඳී ජීවත් වීම බුද්දහම අපේක්ෂා කරයි. පඤ්චශීලයෙහි තෙවන ශික්ෂා පදය වෙසෙසින් ම ඒ සඳහා උපකාරී වෙයි. සදිසා නමස්කාරය අනුව පවුලක ස්වාමි පුරුෂයා තම භාර්යාවට ඉටු කළ යුතු යුතුකම් පහකි.

1. ගෞරවාන්විත ව ක්‍රියා කිරීම
2. අගෞරව නො කිරීම
3. දුසිරිතෙහි නො යෙදීම
4. ඉසුරු පවරා දීම
5. ආභරණ ආදිය ගෙනැවිත් දීම

මෙසේ සිය බිරිඳට ආදර ගෞරවයෙන් යුතුකම් ඉටු කරන ස්වාමි පුරුෂයෝ බිරිඳගෙන් ද පස් ආකාරයෙකින් සංග්‍රහ ලබති.

1. නිවසේ කටයුතු මැනවින් කිරීම
2. පිරිවර ජනයාට සංග්‍රහ කිරීම
3. දුසිරිතෙහි නොයෙදීම
4. මිල මුදල් ආදිය විනාශ නො කිරීම
5. දක්ෂ ව, අනලස් ව සියලු කටයුතු කිරීම

## යහළු මිත්‍රයෝ

ඥාති සබඳතා ලෙස නො සැලකෙන මානව සබඳතා හැඳින්විය හැක්කේ මිතුරු සබඳතා ලෙස ය. මෛත්‍රිය මුල් කර ගත්තේ මිත්‍රත්වය යි. එය දෙයාකාර වෙයි. බුද්දහම අනුව අව්‍යාජ මෛත්‍රිය ඇති යහපත් මිත්‍රයෝ ද සිටිති. ඔවුහු කල්‍යාණ මිත්‍රයෝ වෙත්. ඒ අතර ව්‍යාජ මිත්‍රත්වයක් පෙන්වන මිතුරෝ ද වෙති. ඔවුහු මිත්‍රප්‍රතිරූපකයෝ ය. කලණ මිතුරන් ඇති බව එක් අතෙකින් සසර සැපත ද සතුට ද උදකරයි. අනෙක් අතින් එය විමුක්ති සුවයට ද උපකාරී වෙයි.

මෙලොව දියුණුව උදෙසා ගිහියාට උපදෙස් දෙන බුදුදහම කල්‍යාණ මිත්‍රත්වය ද ඉන් එකකැ යි උගන්වා ඇත. ලෝකයේ කල්‍යාණ මිත්‍රයෝ මෙන් ම පාප මිත්‍රයෝ ද සිටිති. එ බැවින් කල්‍යාණ මිත්‍රයන්ගේ ලක්ෂණ පෙන්වා දෙන බුදුදහම ඔවුන් ඇසුරු කිරීමට ම උපදෙස් දෙයි. පාප මිත්‍ර සේවනය නොයෙක් අයුරින් පුද්ගලයාට අහිත පිණිස දුක් පිණිස ම වේ යැ යි ද උගන්වයි. මිත්‍ර ද්‍රෝහී නොවිය යුතු ය. මිත්‍ර ද්‍රෝහී නොවන්නා සියලු තන්හි පුදනු ලැබේ. සදිසා නමස්කාරය අනුව අප මිතුරන්ට මෙසේ සංග්‍රහ කළ යුතු ය.

1. පරිත්‍යාග කිරීම
2. ප්‍රිය වචනයෙන් කථා කිරීම
3. දියුණුවට අනුබල දීම
4. සමානත්වයෙන් ක්‍රියා කිරීම
5. අවංකව ඇසුරු කිරීම

මිතුරන්ට එ සේ සංග්‍රහ කරන අපට මිතුරෝ ද මෙ සේ සංග්‍රහ කරති.

1. මං මුලාව, ප්‍රමාද වන විට ආරක්ෂා කර ගැනීම
2. අපේ සම්පත් ආරක්ෂා කිරීම
3. බියක් ඇති වූ තැන පිහිට වීම
4. විපතේ දී අත් හැර නො යෑම
5. අපේ පවුලේ අයට ද උපකාර කිරීම

## සේව්‍ය - සේවකයෝ

ස්වාමිවරුන් හෙවත් හාම්පුතුන් සහ සේවක සේවිකාදීන් අතර ඇති අන්‍යෝන්‍ය විශ්වාසය, කැප වීම හා උපකාරිත්වය ද සමාජයක දියුණුවට මහත් සේ බලපාන්නකි. බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ අවදියෙහි භාරතීය පරිසරය තුළ විසූ සේවක සේවිකාවෝ හෙවත් ශ්‍රමිකයෝ යහපත් සමාජ තත්ත්වයකට හිමිකම් නො කීවෝ ය. උසස් යැයි සම්මත වූ ධනවත් කුලවල පාරම්පරික මෙහෙකරුවන් වූ ඔවුහු ශුද්‍රයෝ, පඤ්චමයෝ යැයි නම් කරන ලදහ. පහත් යැයි සම්මත කුලවලට අයත් යැයි කියන ලද ඔවුනට ප්‍රමාණවත් මානව අයිතිවාසිකම් නො ලැබිණ. වැටුපක් ලැබීමට පවා හිමි කමක් නො වී ය. මෙම තත්ත්වය අනුමත නො කළ බුදුරජාණන් වහන්සේ විසින් එම සමාජ බෙදීම් විවේචනය කරමින් සමාජය තුළ සැමට සම තැන හිමි විය යුතු යැයි ද කුලවාදය නිසරු පැනවීමකැයි ද පෙන්වා දෙන ලදී. සේවකයන්ට ස්වාමිවරුන් විසින් කළයුතු සංග්‍රහය බුදුදහමෙහි දක්වා ඇත්තේ ද නමස්කාරයක් ලෙස ය. එම සංග්‍රහය ද පස් ආකාර වේ.

1. හැකියාව අනුව සේවය නියම කිරීම
2. ආහාර පාන හා නිසි වැටුප් ලබා දීම
3. සෞඛ්‍ය පහසුකම් ලබා දීම
4. විශේෂ රසවත් දේ ලබා දීම
5. සුදුසු අවස්ථාවේ නිවාඩු ලබා දීම

මෙම සංග්‍රහයන් නිසා සොම්නස් වන සේවකයෝ ද ස්වාමියාට මෙ සේ සංග්‍රහ කරති.

1. ස්වාමියාට පෙර අවදි වීම හෙවත් කලින් ම වැඩ ඇරඹීම
2. ස්වාමියාට පසු නින්දට යාම හෙවත් නියමිත මුළු කාලය ම වැඩ කිරීම
3. දුන් දේ පමණක් ගැනීම හා නුදුන් දේ නො ගැනීම
4. උසස් ආකාරයෙන් හොඳ සේවයක් කිරීම
5. ස්වාමියාගේ කීර්ති රාවය පැතිර වීම

## ගිහියන් හා පැවිද්දෝ

විධිමත් දැහැමි සමාජ සබඳතාවන්ගේ සවැනි පියවර පූජ්‍ය හෙවත් පූජා ලබන්නන් එනම් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ද පූජක හෙවත් පූජා කරන්නන් එනම් ගිහියන් ද අතර ඇති බැඳීම යි. අන්‍යෝන්‍ය උපකාරීත්වය යි. බෞද්ධ සංස්කෘතිය තුළ ගෘහස්ථයෝ හෙවත් ගිහියෝ උපාසක උපාසිකා නම් වෙති. පැවිදි පක්ෂය භික්ෂු භික්ෂුණීන් ය. මෙකී දෙපක්ෂය අතර අන්‍යෝන්‍ය සබඳතාව මීට පෙර දක්වන ලද සමාජ කොටස් අතර ඇති සම්බන්ධය මෙන් ඥතිත්වය, මිත්‍රත්වය හෝ සේවය මත ගොඩ නැගුණක් නො වේ. එය මිනිස් වර්ගයාගේ උත්තරීතරබවට මූලික වන දහම් මග පෙන්වා දීම මත ගොඩ නැගුණකි. ඒ අනුව ගිහි ජනයා ධර්මය වෙත තමන් යොමු කරන පැවිද්දන් රක්ෂණය පෝෂණය කළ යුතු ය. පැවිදි කොටස් ද තමන්ට ආමිසයෙන් සංග්‍රහ කරමින් තමන් රක්ෂණය පෝෂණය කරන ගිහියනට ධර්ම දානයෙන් සංග්‍රහ කළ යුතු ය. ගිහියන් පැවිද්දන්ට කළ යුතු සංග්‍රහය සදිසා නමස්කාරයෙහි මෙසේ දැක්වෙයි.

1. මෛත්‍රී සහගතව ක්‍රියා කිරීම
2. මෛත්‍රී සහගතව කථා කිරීම
3. මෛත්‍රී සහගත සිත් පහළ කර ගැනීම
4. නිවසට පැමිණෙන විට සතුටින් පිළිගැනීම
5. ආමිසයෙන් සංග්‍රහ කිරීම

ගිහි පක්ෂයෙන් මෙම සංග්‍රහයන් ලබන පැවිදි පක්ෂය සය ආකාරයකින් ගිහියන්ට සංග්‍රහ කරයි.

1. පවින් වළක්වයි.
2. යහපත් ක්‍රියාවල යොදවයි.
3. හොඳ හිතින් ම අනුකම්පා කරයි.
4. නො ඇසූ දේ කියා දෙයි.
5. ඇසූ දේ වඩාත් පැහැදිලි කර දෙයි.
6. සුගතියට මග පෙන්වා දෙයි.

මෙ සේ ඉහත දක්වන ලද දිසා වශයෙන් සය ආකාර වූත්, පිරිස් වශයෙන් දෙළොස් ආකාර වූත් සමාජ කොටස් එකිනෙකාට ඉටු කළ යුතු යුතුකම් හෙවත් සංග්‍රහයන් නිසි පරිදි ඉටු වීම විවිධාකාරයෙන් සමාජයක යහපත උදා කරයි. එක් අතෙකින් ඒ ඒ සමාජ කොටස් අතර විශ්වාසය, සම්බන්ධය තහවුරු වෙයි. සහජීවනය නො බිඳේ. හුදකලා බව පහව යයි. නැකම විශ්වාසය මත පවතින බව බුදුදහමෙහි ඉගැන් වේ. අනෙක් අතින් විශ්වාසය අන්‍යෝන්‍ය ගැටුම්, විරසක වීම්, මත භේද වැළකී යාමට ද හේතු වෙයි. මිනිසුන් අතර බැඳීම් ශක්තිමත් වන බැවිනි. මෙ ම තත්ත්වය සමාජයක සාමකාමී බව ගොඩ නැගීමට අදාළ වන්නේය. මෙකී සමාජ සබඳතාව ගැටුම්වලින් තොර සාමකාමීත්වයට ද, දියුණුවට ද මග පාදයි. මවුපියන්ගේ සංග්‍රහ තුළින් දරුවෝ ද දරුවන්ගේ සංග්‍රහ නිසා මව්පියෝ ද දියුණුවට පත් වෙති. මෙලොව වශයෙන් ලබා ගත යුතු අභිවෘද්ධිය වෙත ළඟා වෙති. ගුරුවරුන්ගේ සංග්‍රහය නිසා ශිෂ්‍යයෝ ද සිසුන්ගේ සංග්‍රහය නිසා ගුරුවරු ද දියුණු වෙති. මෙ සේ සියලු සමාජ කොටස් තුළ දියුණුව උදෙසා සදිසා නමස්කාරය ඉමහත් පිටුවහලක් වේ. මේ සියල්ල තුළින් සතුට, සොම්නස රජ කරන සමාජයක් බිහි වෙයි. මෙලොව දුක් පීඩාවෝ මෙම සමාජ කොටස් අත හැර යති.



## සාරාංශය

පුද්ගලයන් අතරත් සමාජ කොටස් අතරත් සම්බන්ධය සමාජයක යහපැවැත්මෙහි පදනම යි. ඒ සඳහා සදිසා නමස්කාරය වෙසෙසින් මග පෙන්වයි. ඒ ඒ සමාජ කොටස් අතර ඉටු විය යුතු යුතුකම් බුදුරජාණන් වහන්සේ සවිස්තර ව ඉගැන්වූහ. ඒවා නිසි ලෙස ඉටු වීම සමාජ සහයෝගයත් සාමයත් දියුණුවත් සතුටත් ළඟා කරන්නේ ය.

## ක්‍රියාකාරකම්

01. ''සමාජය දැලක් වැනි ය'' පැහැදිලි කරන්න.

02. සදාචාර සංවර්ධනයෙහි ලා ගිහි පැවිදි සම්බන්ධයේ වැදගත්කම පෙන්වා දෙන්න.

03. ''යුතුකම් ඉටු කිරීම මා අගය කරන්නේ ඇයි'' යන මැයෙන් සිසුන් අමතා කරන කථාවක සාරාංශය ලියා දක්වන්න.

## පැවරුම

01. ඔබේ පාසලේ මවුපිය උපහාර උළෙලක් හෝ ගුරු උපහාර උළෙලක් පැවැත්වීම සඳහා වැඩ සටහනක් පිළියෙල කරන්න.